විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2015

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2015.09.14.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## මරණ පාරිතෝෂිකය ගෙවීම හා සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම් සහ සංශෝධිත මරණ පාරිතෝෂික ගෙවීම් කිරීම

විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් 2015.09.15 දින සිට මරණ පාරිතෝෂික හා සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීම කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා පහත සඳහන් අයුරින් කටයුතු කරන්නේ නම් මැනවි.

### 01.මරණ පාරිතෝෂික ගෙවීම

1.1. රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප සහිත පත්වීමක් ලබා එම තනතුරේ සේවය ස්ථිර කර ශුද්ධ සේවා කාලය (ස්ථිර විශ්‍රාම වැටුප් සහිත) වසර 5ක (මාස 60ක්) සම්පූර්ණ කර රාජ්‍ය සේවයේ නියුක්ත කාල සීමාව තුළ මිය යන රාජ්‍ය සේවකයන්ගේ යැපෙන්නන් සඳහා මරණ පාරිතෝෂිකය හිමිවේ.

1.2. පහත සඳහන් පරිදි මියගිය නිලධාරියාගේ/නිලධාරිනියගේ යැපෙනන්නන් වශයෙන් සලකා මරණ පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

1. විවාහක නිලධාරියෙකු/ නිලධාරිනියක මියගිය විට

   යැපෙන අය :- I. නීත්‍යානුකූල භාර්යාව/ පුරුෂයා හා රැකියා විරහිත අවිවාහක දරුවන්ට

2. අවිවාහක නිලධාරියෙකු/ නිලධාරිනියක මියගිය විට

   යැපෙන අය :- I. මව හා පියා

   II. මව පියා නොමැති නම් මියගිය අයගෙන් යැපුනු රැකියා විරහිත අවිවාහක සහෝදර සහෝදරියන්

1.3. උක්ත පරිදි මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම සඳහා ප්‍රතිලාභීන් නොමැති අවස්ථාවක මියගිය නිලධාරියාගෙන් හෝ නිලධාරිනියගෙන් රජයට අය වීම් ඇතොත් එම රජයේ අයවීම් පියවා ගැනීම සඳහා පමණක් මරණ පාරිතෝෂිකය ප්‍රදානය කරනු ලැබේ.

1.4. ගෙවීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුව ඇත.

I. මරණ පාරිතෝෂික ගෙවීම සඳහා ඉල්ලුම් කිරීම PD5 (ඇමුණුම 01) ආකෘතිය මඟින් සිදුකල යුතු අතර පහත සඳහන් ඇමුණුම්ද ඉදිරිපත් කළ යුතුය.

i. මරණ සහතිකයේ සහතික කළ පිටපතක්
ii. මියගිය පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්
iii. ප්‍රාදේශීය ලේකම් සහතික කළ යැපෙන්නන්ගේ වාර්තාව
iv. අවසාන වරට ලබාගත් වැටුප තහවුරු කිරීම සඳහා වැටුප් වාර්තාව
v. සහතික කරන ලද චර්යා සටහනේ පිටපතක්

II. PD5 ආකෘති පත්‍රයෙහි 11 යටතේ යැපෙන්නන් පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතුය. ප්‍රාදේශීය ලේකම් නිර්දේශ වාර්තාව හා නිලධාරියාට අදාළ පෞද්ගලික ලිපිගොනුව ඇසුරෙන් යැපෙන්නන් පිළිබඳව නිවැරදි තහවුරුවක් ආයතන ප්‍රධානියා විසින් ලබා දිය යුතුය. මරණ පාරිතෝෂිකය ගණනය කිරීමෙන් පසු රජයට අය විය යුතු මුදලක් ඇතොත් එය අඩු කර ඉතිරි මුදල යැපෙන්නන් වෙත බෙදී යන ආකාරය 12 යටතේද, අංක 13 යටතේ ආයතන ප්‍රධානීන්ගේ නිල බැංකු ගිණුම් විස්තරයද නිවැරදිව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම යැපෙන්නන්ගේ බැංකු ගිණුම් පොතේ/පොත් වල සහතික කල පිටපතක් PD5 ආකෘතිය සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. මෙම බැංකු ගිණුම් ලංකා බැංකුව, මහජන බැංකුව හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන බැංකු වල පවත්වාගෙන යන තනි ගිණුම් විය යුතුය.

III. බාල වයස්කරුවන් සඳහා (වයස අවුරුදු 18 ට අඩු) ඕනෑම පිළිගත් බැංකුවක බාල වයස්කාර ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කර එහි සහතික කළ පිටපතක් එවීමට කටයුතු කළ යුතුය. එම ගිණුම්වල පාස් පොත් අනත්දරුවන්ගේ භාරකරුවන් වෙත භාරදීම සිදු කළ යුතුය.

IV. නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු අඩු කිරීම් සඳහා මධ්‍යම රජයේ ආයතන වෙත දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන නිදහස් කරන අතර, එමඟින් අයවීම් පියවා ගතයුතු වේ. පළාත් සභා ආයතන වෙත රජයේ අඩු කිරීම් වලට සමානව මුදල් සෘජුවම ආයතනයේ නිල බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කර ඒ පිළිබඳව ආයතන දැනුවත් කරනු ඇත. (එබැවින් නිල බැංකු ගිණුම් පිළිබඳ බැංකුව සහ ගිණුම් අංකය සඳහන් කර නිවැරදිව තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍ය වේ.)

## 02. සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම

2.1. යම් විශ්‍රාමික නිලධාරියෙකු සඳහා සංශෝධිත විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේදී සෘජුවම විශ්‍රාමික නිලධාරියාගේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු සැලසුම් කර ඇති බැවින් සංශෝධිත PD6 සමඟ විශ්‍රාමිකයා දැනටමත් විශ්‍රාම වැටුප් ලබන බැංකු ගිණුමට අදාළ පොතේ සහතික කල පිටපතක් එවීමට කටයුතු කළ යුතුය.

2.2. විශ්‍රාමික නිලධාරියාගෙන් තවදුරටත් රජයට අයවිය යුතු අඩු කිරීම් තිබේ නම් ඒ පිළිබඳ නිවැරදි විස්තර ඉදිරිපත් කළ යුතු අතර, අදාළ අඩු කිරීම් පියවා ගැනීම සඳහා අවශ්‍ය මුදල් ඉහත 1.4 (IV) පරිදි ආයතන වෙත එවීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත.

2.3. විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදු වන හේතුව අනුව අවශ්‍ය අවස්ථා වලදී පහත ලේඛණ අමුණා එවිය යුතුය.

I. සංශෝධනය පෙර අවසානයට නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය
II. සංශෝධිත චර්යා සටහන
III. සංශෝධනට අදාළ වැටුප් පරිවර්තන ලිපිය
IV. උසස් වීම් ලිපිය
V. සංශෝධනය සිදු කිරීමට අදාළ වන්නාවූ වෙනත් ලිපි ලේඛණ උදා :- අමාත්‍ය මණ්ඩල තීරණ
VI. දෛනික සේවා/ පිරිවෙන් හා පෞද්ගලික පාසල් ගුරුවරුන් සඳහා සේවා කාලය එකතු කර ඇත්නම් එම කාලයට අදාළව අය කරන ලද දායක මුදල් විස්තරය

**03. සංශෝධිත මරණ පාරිතෝෂිකය ගෙවීම**

3.1. සංශෝධිත මරණ පාරිතෝෂිකය ගෙවීම සම්බන්ධයෙන්ද ඉහත අංක 02 පරිදි කටයුතු කළ යුතුය.

3.2. විශ්‍රාම වැටුප් හා මරණ පාරිතෝෂික සංශෝධන අයදුම් පතෙහි (PD6) 28 I හා II ඇතුලත් තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර එවීම අනිවාර්ය වන අතර, යැපෙන්නන්ගේ බැංකු ගිණුම් පොතේ/පොත් වල සහතික කල පිටපතක්ද එවිය යුතුය.

**04. උක්ත සංශෝධනයන් සම්බන්ධව ප්‍රදාන පත්‍රයන් නිකුත් කරනු ලබන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්මේන්තුව මඟිනි. ඒ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මඟින් ලබාගත් සංශෝධිත ප්‍රදානයේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීමට කටයුතු කරන්න.**

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - පෞද්ගලික ලිපිගොනු සංරක්ෂණය සඳහා අවස්ථාව ලබාදීමේ වැඩපිළිවෙල විධිමත් කිරීමට සහයෝගය ලබා ගැනීම සඳහා.

ආකෘතිය } PD 05

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.**

Sri Lanka Pension

## මරණ පාරිතෝෂික අයදුම්පත

| | |
|---|---|
| මරණ පාරිතෝෂික අංක (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) | |

1. ආයතනයේ නම :- ……………………………………………………………………………..
2. සේවා තත්ත්වය
   i. නිලධාරියා / නිලධාරිණියගේ නම :- ……………………………………………………..
   ii. මිය යන අවස්ථාවේ දැරූ තනතුර හා නිලනාමය :- …………………………………………
   iii. මිය යන අවස්ථාවේ දැරූ තනතුර හා නිලනාමය(ඉංග්‍රීසියෙන්) :-…………………………….
   iv. මිය ගිය දිනය :- ………………………………………………………………………..
   v. තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතද? :- …………………………………………………….
   vi. තනතුරෙහි ස්ථිර කර තිබේද? :-………………………………………………………….
   vii. විශ්‍රාම යන විට සේවය කරන ලද්දේ මධ්‍යම රජයේ ද/පළාත් රාජ්‍ය සේවයේද යන්න :- ……………….
3. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අංකය :- ………………………………………
4. වැන්දඹුවගේ/වැන්දඹු පුරුෂයාගේ පෞද්ගලික දුරකතන අංකය :- ……………………………………..

5. සේවා කාලය :-

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| මරණ පාරිතෝෂිකය සඳහා ගණන් ගත හැකි දළ සේවා කාලය (විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 09/2004 අනුව) ගණනය කළ යුතුය. | | | |

6. වැටුප :-

| | | රුපියල් | ශත |
|---|---|---|---|
| i | විශ්‍රාම යන දිනට ඒකාබද්ධ වැටුප | | |
| ii | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 9/96 අනුව හිලව් කළ හැකි වැටුප් රහිත නිවාඩු | | |
| iii | මරණ පාරිතෝෂිකය ගණනයට අදාල දළ වාර්ෂික වැටුප | | |

7. වැටුප් රහිත නිවාඩු :-

| | | අවුරුදු | මාස | දින |
|---|---|---|---|---|
| i | සම්පූර්ණ වැටුප් රහිත සේවා කාලය | | | |
| ii | සම්පූර්ණ වැටුප් සහිත දීමනා (හිමිකම් පමණි) | | | |
| iii | ඉහත ii කොටසේ වැටුප් රහිත නිවාඩු අඩු කිරීමෙන් පසු වැටුප් රහිත නිවාඩු | | | |

8. මියගිය දිනයට හිමි දළ වාර්ෂික ඒකාබද්ධ වැටුපට අදාළ රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ අංකය …………….

9. ප්‍රතිශත ගණනය කිරීම.

| | | අඩු කළ% | අඩු නොකළ% |
|---|---|---|---|
| i | සේවා කාලය අවුරුදු 25 හෝ ඊට වැඩිනම් චක්‍රයට අනුව හිමි ප්‍රතිශතය | | |
| ii | සේවා කාලය අවුරුදු 25 ට වඩා අඩුනම් අවුරුදු 25 සේවයට හිමි ප්‍රතිශතය | | |
| iii | සේවා කාලය අවුරුදු 25 වඩා අඩුනම් සෑම 06 මාසයක් හෝ ඊට අඩු සෑම කාල සීමාවක් සඳහා 1% බැගින් අඩුකළයුතු ප්‍රතිශතය(වසර 25 වැඩිනම් අනවශ්‍යය) | | |
| iv | වැටුප් රහිත මාසයක් හෝ ඊට අඩු කාලසීමාවක් සඳහා 0.2% බැගින් අඩු කල යුතු ප්‍රතිශතය (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/96) | | |
| v | ඉහත ගැලපීම් වලින් පසුව නිළධාරියාට විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පදනම් කරගතයුතු ශුද්ධ ප්‍රතිශතය | | |

10. පරිවර්තිත පාරිතෝෂිකය ගණනය කිරීම :-

| | | රුපියල් | ශත |
|---|---|---|---|
| i | පරිවර්තිත පාරිතෝෂික මුදල<br>(දළ වාර්ෂික වැටුප x අඩුනොකල ශුද්ධ ප්‍රතිශතය x 2 ) | | |
| ii | මියගිය දිනට අදාල වාර්ෂික වැටුප | | |
| iii | ඉහත i සහ ii ට අදාල මුදල් වලින් වැඩි අගය (ඒ අනුව වැඩි මුදල මරණ පාරිතෝෂිකය ලෙස ප්‍රදානය කල හැකිය) | | |
| iv | රජයට අයවිය යුතු මුදල් | | |
| v | හිමිවන ශුද්ධ පාරිතෝෂික මුදල | | |

11. යැපෙන්නන් පිළිබඳ තොරතුරු :-

| සම්පූර්ණ නම | මියගිය පුද්ගලයාට ඇති ඥාතීත්වය | උපන් දිනය | විවාහක / අවිවාහක බව / වැන්දඹු | රැකියාව ඇත/ නැත | ලිපිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

12. පාරිතෝෂිකය බෙදීයන ආකාරය

| සම්පූර්ණ නම | ලැබිය යුතු මුදල | බැංකුවේ නම | ශාඛාව | ගිණුම් අංකය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

13. ආයතන ප්‍රධානියාගේ බැංකු ගිණුම් තොරතුරු :-

| බැංකු ගිණුම් නාමය | බැංකුව | ශාඛාව | ගිණුම් අංකය |
|---|---|---|---|
| | | | |

......................................................................................................... (තනතුර) ලෙස සේවය කරමින් සිටියදී මියගිය …........................................................................... (නම) වන අයදුම්කරුගේ තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, එමෙන්ම මරණ පාරිතෝෂික අංකයක් ලබා දී ඉහත 12 හි සඳහන් ආකාරයට ඔහුගේ යැපෙන්නන් හට හිමි මරණ පාරිතෝෂික මුදල් ගිණුම්වලට සෘජුවම ප්‍රේෂණය කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය……………………………. 

...........................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නම සහිත නිල මුද්‍රාව)

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.**

**විශ්‍රාම වැටුප් පාරිතෝෂික හා මරණ පාරිතෝෂික සංශෝධන අයදුම්පත**

ආකෘතිය } PD6

I කොටස

| | |
|---|---|
| වි.වැ. අංකය/මරණ පාරිතෝෂික අංකය<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි) | |

---

අයදුම්පත අදාළ වන්නේ

විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා ☐ මරණ පාරිතෝශික සංශෝධනය සඳහා ☐

1. නිලධාරියාගේ/නිලධාරිනියගේ සම්පූර්ණ නම :- ....................................................................................................................................................................................................

2. මුලකුරු සමඟ අගට යෙදෙන නම:-
   (ENGLISH BLOCK LETTERS)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

3. උපන් දිනය:- ..........................................................................................................
4. විශ්‍රාම ගිය දිනය/මිය ගිය දිනය :- ..........................................................................
5. ස්ථිර පදිංචි ලිපිනය :- ........................................................................................................................................................................................................
6. පෞද්ගලික දුරකතන අංකය:- ..................................................................................

<u>සේවා තොරතුරු</u>

7. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය :- ...................................................................
8. **විශ්‍රාම යන විට සේවය කරන ලද්දේ මධ්‍යම රජයේද / පළාත් රාජ්‍ය සේවයේද?**..........................................
9. ආයතනය සෘජුවම සම්බන්ධ කල හැකි දුරකතන අංකයක් :- ....................................................
10. සංශෝධනයට අදාල වන්නා වූ හේතුව :- ........................................................................
11. **සංශෝධනයට පෙර තනතුර සහ නිල නාමය** :- ..............................................................
12. **සංශෝධනයට පසු තනතුර සහ නිල නාමය** :-...............................................................
13. **සංශෝධනයට පසු තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතද?** ..................................................
14. **සංශෝධනයට පසු තනතුර ස්ථිර කර ඇත්ද?** ...................................................................
15. **වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත්දරු සමාජික අංකය** : ...................................................

16. සේවා කාලය

| | | සංශෝධනයට පෙර | | | සංශෝධනයට පසු | | |
|---|---|---|---|---|---|---|---|
| | | අවු. | මාස | දින | අවු | මාස | දින |
| I | විශ්‍රාම වැටුප් ගණනයට අදාල පුහුණු සේවා කාලය | | | | | | |
| II | වැන්දඹු අනත්දරු දායක මුදල් අයකර ඇති අනියම්/දෛනික සේවා කාලය | | | | | | |
| III | ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය | | | | | | |
| IV | විශ්‍රාම වැටුප් ගණනයට අදාල මුළු සේවා කාලය | | | | | | |

ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

17. සංශෝධනයට හේතුව දෛනික සේවා කාලය එකතුවීම මත සේවා කාලය වැඩිවීම නම් එම දෛනික සේවා කාලයට අදාලව වැන්දඹු අනත්දරු දායක මුදල් අයකර ඇත්ද? ............................................................

18. අයකර නොමැති නම් අයකල යුතු ප්‍රමාණය කොපමණද?.........................................................................

19. දෛනික සේවා කාලයට අදාලව වෙනත් ප්‍රතිලාභයක් ලබාගෙන ඇතිද ? එය කුමක්ද? .....................

.......................................................................................................................................................

20. වැටුප් රහිත නිවාඩු

| | | සංශෝධනයට පෙර | | | සංශෝධනයට පසු | | |
|---|---|---|---|---|---|---|---|
| | | අවු. | මාස | දින | අවු. | මාස | දින |
| I | සම්පූර්ණ වැටුප් රහිත සේවා කාලය | | | | | | |
| II | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/96 , 1/98 සහ රා.ප.ච. 4/2010 අනුව හිලව් කල හැකි වැටුප් රහිත නිවාඩු | | | | | | |
| III | ඉහත II කොටස වැටුප් රහිත නිවාඩු අඩු කල පසු ඉතිරි වැටුප් රහිත නිවාඩු | | | | | | |

20. **වැටුප් විස්තරය**

| | | සංශෝධනයට පෙර | | සංශෝධනයට පසු | |
|---|---|---|---|---|---|
| I | විශ්‍රාම යන දිනට වාර්ෂික ඒකාබද්ධ වැටුප | රු | ශත | රු | ශත |
| II | වයස අවුරුදු 60 සම්පූර්ණව විශ්‍රාම යන්නේ නම් උපයාගත් වැටුප් වර්ධක අගය | | | | |
| III | විශ්‍රාම වැටුප් සහිත දීමනා (හිමිනම් පමණි)<br>1.<br>2.<br>(දීමනාව කුමක්ද යන්න පැහැදිලිව සඳහන් කරන්න) | | | | |
| IV | විශ්‍රාම වැටුප් ගණනයට අදාළ දළ වාර්ෂික වැටුප | | | | |
| V | විශ්‍රාම ගන්නා දිනට හිමි දල වාර්ෂික ඒකාබද්ධ වැටුපට අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකය<br>(ආයතනය සඳහන් කරන්නේ නම් එයට අදාල රා.ප. චක්‍රලේඛය සඳහන් කල යුතුයි) | | | | |

21. විශ්‍රාම යන දිනට අදාල වාර්ෂික වැටුප් පරිමාණය :- ..........................................................................

22. වැටුපේ උපරිමයට පත් වූ දිනය :- ...........................................................................................

23. වැටුපේ උපරිමය ඉක්මවා ඇත්නම් එයට හේතු :- ..........................................................................

24. සංශෝධිත වැටුප ගෙවීම ආරම්භ කල යුතු දිනය :- .......................................................................

ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

25. ප්‍රතිශතය ගණනය කිරීම

| | | සංශෝධනයට පෙර | | සංශෝධනයට පසු | |
|---|---|---|---|---|---|
| | | අඩු කල % | අඩු නොකල % | අඩු කල % | අඩු නොකල % |
| I | සේවා කාලය අවුරුදු 25 හෝ ඊට වැඩි නම් හිමි ප්‍රතිශතය | | | | |
| II | සේවා කාලය අවුරුදු 25 ට අඩු නම් අවු 25 ක සේවයට හිමි ප්‍රතිශතය | | | | |
| III | වසර 25 ට අඩු නම් සෑම 6 මාසයක් හෝ ඊට අඩු සෑම කාල සීමාවක් සඳහා 1% බැගින් අඩු කල යුතු ප්‍රතිශතය(වසර 25 ට වැඩි නම් අනවශ්‍යයි) | | | | |
| IV | වැටුප් රහිත මාසයක් හෝ ඊට අඩු සෑම කාල සීමාවක් වෙනුවෙන් 0.2% බැගින් අඩුකල යුතු ප්‍රතිශතය(වැ.වැ.චක්‍රලේඛ 9/96) | | | | |
| V | ඉහත ගැලපීම් වලින් පසුව නිලධාරියාට විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පදනම් කරගත යුතු ශුද්ධ ප්‍රතිශතය | | | | |

26. ශුද්ධ පාරිතෝශික මුදල ගණනය කිරීම

| | | රු. | ශත. |
|---|---|---|---|
| I | නව පරිවර්තිත පාරිතෝශික මුදල (දල වාර්ශික වැටුප x අඩු නොකළ ශුද්ධ ප්‍රතිශතය x 2) | | |
| II | **සංශෝධනයට පෙර පරිවර්තිත පාරිතෝශික මුදල** | | |
| III | **නව සංශෝධනයේදී අය කළ යුතු රජයට අය වීම්** | | |
| IV | ගෙවිය යුතු හිඟ පාරිතෝශික මුදල | | |

27. විශ්‍රාමිකයාගේ බැංකු ගිණුම් අංකය / බැංකුව හා ශාඛාව :- ..........................................................

28. සංශෝධිත මරණ පාරිතෝෂිකයක් නම් :-

I. යැපෙන්නන් පිළිබඳ තොරතුරු :-

| සම්පූර්ණ නම | මියගිය පුද්ගලයාට ඇති ඥාතීත්වය | උපන් දිනය | විවාහක / අවිවාහක බව / වැන්දඹු | රැකියාව ඇත/ නැත | ලිපිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

II. පාරිතෝෂිකය බෙදීයන ආකාරය

| සම්පූර්ණ නම | ලැබිය යුතු මුදල | බැංකුවේ නම | ශාඛාව | ගිණුම් අංකය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

29. ආයතන ප්‍රධානියාගේ බැංකු ගිණුමේ තොරතුරු :- ..........................................................................

| බැංකු ගිණුම් නාමය | බැංකුව | ශාඛාව | ගිණුම් අංකය |
|---|---|---|---|
| | | | |

............................................................................................................(තනතුර) ලෙස සේවය කළ/ කරමින් සිටියදී මියගිය ...............................................................................................(නම) වන අයදුම්කරුගේ තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, එමෙන්ම ඔහුට/යැපෙන්නන්ට හිමි පාරිතෝෂික මුදල ගිණුමට සෘජුවම ප්‍රේෂණය කිරීමට සුදුසු බවටත් නිර්දේශ කරමි.

දිනය :- ...................................

..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම සහිත නිලමුද්‍රාව